**ගාල්ල මහා නගර සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 03 දින ද නගරාධිපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු ව්‍යාපාර බදු ශේෂය රු.5,496,321 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.9,066,045 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු ආදායම රු.3,276,600 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,986,200 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.1,206,196 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | ඉකුත් වසර 05 හි මුද්දර ගාස්තු ආදායම් වල සාමාන්‍යය පිළිබඳව නොසලකා අයවැයගත මුද්දර ගාස්තු ආදායම් ලෙස රු.100,000,000 ක් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් අධි තක්සේරු වී තිබුණි. | නිවැරදි ශේෂයන් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයට ගෙවියයුතු විගණන ගාස්තු සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනයන් ඇතිකළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේ දී අය කරන ලද රු.5,830,583 ක් වූ පෙරසැරි ගාස්තුව වගකීම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | වගකීම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී විධිමත් අනුමැතියකින් තොරව එකතුව රු.505,667 ක්වූ ගනුදෙනු සමුච්චිත අරමුදලට බැර කර තිබුණු අතර, රු.1,934,029 ක්වූ ගනුදෙනු සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | ගනුදෙනු සඳහා අනුමැතිය ලබාගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | ඉකුත් වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.103,673,560 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල් වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විශ්‍රාම වැටුප් සඳහා ප්‍රතිපාදනයන් ඇතිකල යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.33,284,580 ක් වූ මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | මුද්දර ගාස්තු අයවැයගත මුදල ගිණුම් ගතකර ඇති බව දන්වමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.17,985,748 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2003 වර්ෂයේ සිට පැවති රු.111,553 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර ගත යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කරන බව දන්වමි. |

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ලැබිය යුතු ගිණුම්** | | |
| (i) | ඉකුත් වර්ෂය අවසානයට රු.561,721,172 ක් වූ ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු.648,308,725 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, එය මුළු වත්කම්වලින් සියයට 45 ක් තරම් විශාල අගයක් විය. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |
| (ii) | ගිණුම් ශේෂ 14 කට අයත් එකතුව රු.46,382,556 ක් වූ ශේෂය වසර කීපයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවත එමින් තිබූ අතර, එම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිගින් දිගටම පැවත එන ගිණුම් ශේෂ නිරවුල් කරගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **ගෙවිය යුතු ගිණුම්** | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.135,931,579 ක් වූ පොදු සැපයුම් ණයහිමියන් වර්ෂය අවසානයට රු.139,134,883 දක්වා වැඩි වී තිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් කරගත යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.475,086,428 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන වල වූ රු.68,386,691 ක් වූ තොග ශේෂය තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත 247(ඇ) වගන්තිය | සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු අය කිරීමක් කර නොතිබූ අතර, එවැනි ඉඩම් සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛනයක් සකස් කර බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී අදාළ පරිදි කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.141,182,555 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.178,438,560 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කල බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව වසර දෙකකට අධික කාලයක සිට එන එකතුව රු.239,996 ක් වූ ගණුදෙනු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දීර්ඝකාලීන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |
| (ආ) | වටිනාකම රු.518,317 ක් වූ අගරු චෙක්පත් ශේෂයෙහි ඇතුළත් රු.55,474 ක් වටිනා චෙක්පත් සම්බන්ධ තොරතුරු සභාව සතුව නොවූ අතර, වසරකට අධික කාලයක සිට පැවත එමින් තිබූ රු.209,128 ක් වටිනා අගරු චෙක්පත් 16 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු සොයා ගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල මාස 06 ඉක්ම වූ රු.295,482 ක් වටිනා චෙක්පත් 62 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 111,510,000 | 87,666,373 | 92,705,195 | 145,408,000 | 111,510,000 | 106,365,583 | 105,113,546 | 142,355,829 |
| කුලී | 105,582,275 | 39,000,691 | 55,839,507 | 44,589,860 | 105,582,275 | 48,236,132 | 42,975,003 | 26,184,809 |
| බලපත්‍ර ගාස්තු | 42,104,000 | 7,412,560 | 31,949,557 | 7,386,142 | 42,104,000 | 37,150,353 | 36,326,845 | 9,468,570 |
| වෙනත් ආදායම් | 158,007,000 | 131,791,628 | 133,666,570 | 450,924,723 | 158,007,000 | 170,068,921 | 84,220,934 | 8,237,753 |
| | 417,203,275 | 265,871,252 | 314,160,829 | 648,308,725 | 417,203,275 | 361,820,989 | 268,636,328 | 186,246,961 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා දේපල 06 ක් සඳහා සමාලෝචිත වර්ෂයට බිල්කළ බිම්බදු හා එලදාබදු වටිනාකම රු. 7,434,630 ක් විය. රැස්කළ යුතු ආදායම රු. 15,017,368 ක් වුවද රැස්කර තිබුණේ රු. 3,251,780 ක් පමණක් වූයෙන් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 22 ක් විය. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.3.3 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂය අවසානයට රු.131,869,573 ක් වූ හිඟ වරිපනම් බදු හිඟය සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.135,067,229 ක් දක්වා වර්ධනය වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | රතු නිවේදන නිකුත් කර ඇති අතර, ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ඇතැම් රාජ්‍ය හා පෞද්ගලික ආයතන දිගින් දිගටම වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ අතර, එවැනි ආයතන 147 ක රු. 115,714 සිට රු. 2,683,125 දක්වා පරාසයක බදු පැහැර හැරීම් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | රටේ පැවති කබලකාරී වාතාවරණය මත බදු මුදල් අය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවූ බව දන්වමි. |

## 2.3.4 කුලී ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය ආරම්භයට රු.26,184,289 ක් වූ හිඟ කුලී වර්ෂය අවසාන වන විට රු.32,023,215 ක් දක්වා වර්ධනය වී තිබුණි. | කුලී ගිවිසුම් ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ තොරතුරු ලබා ගැනීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමට ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව එම තොරතුරු පද්ධතිය 2013 ජූලි 02 දින සකස් කර අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වුවද, මේ සඳහා රු.4,081,950 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාළ තොරතුරු පද්ධතිය සකස් කර සභාවට භාර දී නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර සභාවේ කාර්යයන් සඳහා යොදවා ගත යුතුවේ. | ව්‍යාපෘතිය 2015 වර්ෂයේ දී සභාවට භාර දී ඇති බව දන්වමි. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Out come) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරි ඉතුරුම් ගිණුමේ පවතින රු.10,204,152 ක මුදලක් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදාගෙන නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා යොදා ගත යුතුවේ. | ඉදිරියේ දී භාවිතා කිරීමට කටයුතු කරමි. |

**(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිවිසුම් ප්‍රකාරව 2018 මාර්තු 28 දිනට හෝ ඊට පෙර නගර ශාලාව අළුත්වැඩියා කර අවසන් කළයුතු නමුත්, 2020 අප්‍රේල් 27 දින වනවිටත් අළුත්වැඩියාව නිමකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**(ඇ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම් හා උපදෙස් මත සැලසුම් සකස් කිරීම සිදු කිරීමට නියමිත බව දන්වමි. |

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | බෝපේ හරස් පාර කාණුව සකස් කිරීමට රු.1,550,645 ක මුදලකට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුම් අත්සන් කළ අතර, 2018 පෙබරවාරි 08 දිනට පෙර අවසන් කළ යුතුව තිබුණි. කොන්ත්‍රාත් කරුගේ හේතුවක් හා පදිංචිකරුවන්ගේ ආරවුලක් මත ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකිව අතර මග නතර කර තිබුණි. | ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව අවසන් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| | ඉටුකළ කොටසේ කාණුව කොන්ක්‍රීට් කිරීමේ දී මිලි මීටර් 08 කම්බි 10 යෙදීම වෙනුවට කම්බි 08 ක් යෙදීම නිසා ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා කම්බි කි.ග්‍රෑ.87 ක් අඩුවෙන් යොදා තිබුණි. | ඇස්තමේන්තුවට අනුව කම්බි යෙදිය යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | ගාල්ල සරණංකර පාර පැති බැම්ම ඉදිකිරීමේ දී වැඩ විෂය අංක 5 යටතේ Plywood Form Work මිලි මීටර් 16 ඝනකමකින් යුක්ත විය යුතු නමුත් මිලි මීටර් 12.5 ක ඝනකම සහිතව යොදා තිබීම හේතුවෙන් රු.23,439 ක් ද, විෂය අංක 07 ප්‍රකාරව රු.88,885 ක් ද වැඩියෙන් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු නිසි පරිදි සකස් කළයුතු අතර, ඒ අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට 2018 දක්වා කාලයට අදාළ රු.5,980,920 ක් වූ විගණන ගාස්තු ගෙවා නොතිබුණි. | මහා නගර සහා පනත ප්‍රකාරව වාර්ෂිකව විගණන ගාස්තු ගෙවිය යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | නාගරික මුදල් දෙපාර්තමේන්තුව පැවති ගොඩනැගිල්ල අළුත්වැඩියා කරන තෙක් වැය අංශය වෙනත් ස්ථානයක පවත්වාගෙන යෑම සඳහා 2018 ජනවාරි 04 දින සිට 2020 පෙබරවාරි 12 දින දක්වා වසර දෙකක් සඳහා ගිවිසුම්ගත වී තිබුණි. ගිවිසුම් අනුව මසකට රු.60,000 බැගින් රු.1,440,000 ක මුදලක් ගෙවා තිබුණි. වසර 02 කට අධික කාලයක් ගත වී තිබූ නමුත්, අදාළ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට හෝ වෙනත් ස්ථානයක් පිළියෙල කිරීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට වැඩ පිළිවෙලක් සැකසීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | කසළ බැහැර කරනු ලබන ඉඩම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | බලපත්‍රයක් ලබා ගත යුතුවේ. | බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| (i) | මාණ්ඩලික හා ද්විතීයික මට්ටමේ තනතුරු 04 ක අතිරික්තයක් හා පුරප්පාඩු 126 ක් පැවැතුණි. බඳවාගෙන තිබුණු කොන්ත්‍රාත් හා අනියම් සේවකයින් 100 දෙනෙකුගේ සේවය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමටත් අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මහජන පුස්තකාල ප්‍රමිති තනතුරු 06 ක සේවකයින් 23 ක පුරප්පාඩු හා තනතුරු 2 ක සේවක අතිරික්ත 08 ක් විය. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත් අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 ඔක්තෝබර් 15 දිනැති මහා සභා රැස්වීමේ යෝජනා සම්මතයක් අනුව නාගරික ඉංජිනේරුවරයා රාජකාරි කටයුතුවලින් ඉවත් කර තිබුණු අතර, 2020 ජනවාරි මාසය දක්වා සේවය ලබා ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස රු.1,220,546 ක් ගෙවා තිබුණි. | රාජකාරි පැවරීම හා ඉවත් කිරීම විධිමත් පරීක්ෂණයකින් කළ යුතුවේ. | රාජකාරි පැවරීම හෝ වෙනත් ස්ථානයකට මාරුකර යැවීම සම්බන්ධයෙන් පියවර ගැනීමට දන්වා තිබුණ ද, මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දන්වමි. |

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංචාරක මණ්ඩලයේ අනුමත ආයතන 08 ක් සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ගෙවා නොතිබූ අතර, තවත් ආයතන 06 කින් මුළු ලැබීම් මත අයකලයුතු සියයට 1 ක ගාස්තු අයකර නොගැනීම හේතුවෙන් රු.1,092,109 ක ආදායමක් අහිමි වී තිබුණි. | සංචාරක මණ්ඩලයේ අනුමත ආයතනවලින් අදාළ ගාස්තු අය කළ යුතුවේ. | බලපත්‍ර ගාස්තු ගෙවා නොමැති ආයතන සඳහා නඩු පැවරීමට කටයුතු යොදා ඇති බව දන්වමි. |

## 3.6 වත්කම් කළමනාකරණය

### 3.6.1 වත්කම් නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලය පිහිටි ගොඩනැගිල්ලේ ඉහළම මහළයේ කොන්ක්‍රීට් තට්ටුව (slab) පුපුරා තිබූ අතර, ඇතැම් තැන්වල බිත්ති පුපුරා තිබුණි. | වත්කම් නිසි පරිදි නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම සිදුකළ යුතුවේ. | අවස්ථා කිහිපයකදී ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහජන පුස්තකාලයේ ආරක්ෂාව සඳහා රු.562,800 ක් වූ ආරක්ෂිත කැමරා 16 ක් මිලදී ගෙන තිබූ අතර, වගකීම් කාලය ඉක්මවීමටත් පෙර වසරක් වැනි කෙටි කාලයක් තුළ , එම කැමරා පද්ධතිය අක්‍රීය වී තිබුණි. | කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |

**3.6.2** **වාහන උපයෝජනය**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 106 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවක් සිදු කරන බව දන්වමි. |

**3.7** **ප්‍රසම්පාදනය**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සංග්‍රහයේ 3.4.3(ඇ) වගන්තියට පටහැනිව ලියාපදිංචි නොමැති සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා භාණ්ඩ මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන සංග්‍රහයේ වගන්තිය ප්‍රකාරව මිල ගණන් කැඳවිය යුතුවේ. | අත්‍යාවශ්‍ය සේවා ඉටු කිරීම සඳහා කඩිනමින් අමතර කොටස් ලබා ගැනීමට සිදුවන බව දන්වමි. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

------------------------------------------------

**අභ්‍යන්තර විගණනය**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර, සෑම මසකම හා ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂිකව වාර්තාවන් කළමනාකරණයට ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |